ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ
***

## පුවත්පත් නිවේදනය

**79 වන ඉන්දීය නිදහස් දින සැමරුම**

79 වන ඉන්දීය නිදහස් දිනය මහත් උද්‍යෝගයකින් 2025 අගෝස්තු 15 වන දින ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන් හිදී සමරන ලදී. කොළඹ පැවති ප්‍රධාන උත්සවය ඉන්දියානු මහ කොමසාරිස්තුමාගේ නිල නිවස වන 'ඉන්දියා හවුස්' හිදී පැවැත්විණ. මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා ඉන්දීය ජාතික ධජය එසවීමෙන් අනතුරුව හමුදා උත්තමාචාර නිරීක්ෂණය කළේය. ඉන්දීය ජනාධිපතිතුමිය විසින් 79 වන ඉන්දීය නිදහස් දිනයට පෙර දින ජාතිය අමතා සිදු කරන ලද කතාවෙන් උපුටා ගත් කොටස් ද එතුමා විසින් මෙහිදී ඉදිරිපත් කරන ලදී.

2. විවිධ සංස්කෘතිකාංග රැසක් මෙම අවස්ථාව තවත් විචිත්‍රවත් කල අතර ශ්‍රී ලංකා නාවික හමුදා තූර්ය වාදක කණ්ඩායම වීරත්වය සහ ජාත්‍යාලය සංකේතවත් කරන මිහිරි තනු වාදනය කල අතර ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ සිසු සිසුවියෝ ප්‍රසිද්ධ දේශානුරාගී ගීතයන් ඉදිරිපත් කළහ.

3. මහ කොමසාරිස්තුමා සහ මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීහු ශ්‍රී ලංකාවේ සාමය සහ එක්සත්භාවය ආරක්ෂා කිරීම උදෙසා දිවි පිදූ ඉන්දීය සාම සාධක හමුදා විරුවන් වෙනුවෙන් ඉන්දීය සාම සාධක හමුදා ස්මාරකයේ දී සිය උපහාරය ද පුද කළහ.

4. මහනුවර සහකාර මහ කොමසාරිස් කාර්යාලය සහ යාපනය සහ හම්බන්තොට ඉන්දීය කොන්සියුලර් ජනෙරාල් කාර්යාල විසින් ද විශේෂ නිදහස් දින සැමරුම් සංවිධානය කර තිබිණ.

6. ලොව අග්‍රගණ්‍ය වයලින් වාදකයකු වන ආචාර්ය එල්. සුබ්‍රමනියම් මහතා සහ ප්‍රවීණ චිත්‍රපට පසුබිම් ගායිකා කවිතා ක්‍රිෂ්ණමූර්ති මහත්මිය සහභාගී වන 'Bollywood & Beyond' ප්‍රසංගය අද පස්වරු 6ට කොළඹ 07, නෙළුම් පොකුණ රඟහලේදී පැවැත්වීමට නියමිතය. 79 වැනි ඉන්දීය නිදහස් දිනය සමරමින් හැව්ලොක් සිටි මෝල්, ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය සහ කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය හා එක්ව සංවිධානය කරන 'India Fest 2025' යන විචිත්‍රවත් උත්සවය 2025

අගෝස්තු 15-17 දක්වා තෙදිනක් පුරා පැවැත්වෙනු ඇත. එය ඉන්දියාවේ පොහොසත් උරුමය පිළිබඳ අපූර්ව අත්දැකීමක් ජනතාවට ලබා දෙමින් ඉන්දියානු විලාසිතා, අත්කම්, ආහාර පාන, සජීවී ඉදිරිපත් කිරීම්, චිත්‍රපට ප්‍රදර්ශනයන් සහ සංස්කෘතිකාංග ඇතුළු රැසකින් සමන්විත වනු ඇත.

***

කොළඹ
2025 අගෝස්තු 15